**හැටන් - නුවරඑළිය මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති - 2018**

---

හැටන් - නුවර එළිය මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල සමඟ එළඹි 2010 නොවැම්බර් 02 දිනැති අංක එස් ආර් අයි-20 දරණ ණය ගිවිසුමේ විධිවිධානයන් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා අදහස් කරනු ලබන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ණය ගිවිසුම අනුව, එවකට උසස් අධ්‍යාපන සහ මහාමාර්ග, අමාත්‍යාංශය, වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම පළාතේ සමාජ ආර්ථික වර්ධනය පෙළඹවීම සහ සංවර්ධනය සමානුපාත කිරීම සඳහා කි.මී 35.60ක් දිගින් යුතු හැටන් - නුවර එළිය මාර්ගය ඉදිකිරීම, කොටගල උමඟ සහ නානු ඔය උමං දුම්රිය පාළම ඉදිකිරීම තුළින් නුවර එළිය දිස්ත්‍රික්කයේ වෙළඳපොල වෙත පිවිසුම වැඩිදියුණු කිරීම රැකියා අවස්ථා ඇතිකිරීම සහ සමාජ සේවා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 9,061 ට සමාන එ.ජ.ඩො.මිලියන 70.40 ක් වූ අතර ඉන් රු.මිලියන 7,049.37 කට සමාන එ.ජ.ඩො.මිලියන 57.14 ක් මූල්‍යනය කිරීමට ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2011 දෙසැම්බර් 01 දින ආරම්භ කර තිබුණු අතර 2015 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. මීට අමතරව ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල රු.මිලියන 2,010.2 කට සමාන එ.ජ.ඩො.මිලියන 17 ක පරිපූරක ණය මුදලක් මිල විචලනය සඳහා මුහුණ දීමට සහ කොටගල උමඟ සහ නානුඔය උමං දුම්රිය පාළම ඉදිකිරීම්වල පැවති අමතර වැඩ ඉටුකිරීම සඳහා ලබා දීමට එකග වී තිබුණි. තවද පසුකාලීන ව්‍යාපෘතියේ ඉතිරි මුදල් භාවිතයෙන් අවිස්සාවේල්ල හැටන් මාර්ගයේ කි.මී. 68.5 සිට කි.මි. 72 දක්වා වූ කොටස වැඩි දියුණු කිරීමට තීරණය කරන ලද අතර එම ව්‍යාපෘතියේ කාලය 2016 ජනවාරි 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්වාගණනය කළ මතය

---

මාගේ වාර්තාවේ 2.1 ඡේදයේ විස්තර කරන ලද කරුණුවල බලපෑම හැර මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මඟින් 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. එම පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකි වන අයුරින් තම සියලුම ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් සම්බන්ධ පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනයේ දී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන චෝදනා ඇති අය සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| හැටන් - නුවරඑළිය මාර්ගය පුනරුත්ථාපනය කිරීම, කොටගල උමං මාර්ගය නානුඔය දුම්රිය උමං පාලම සහ අවිස්සාවේල්ල හැටන් මාර්ගයේ කි.මී. 68.5 සිට කි.මි.72 දක්වා කොටස පුනරුත්ථාපනය කිරීම 2016 දෙසැම්බර් 31 දිනවන විට අවසන් වී තිබුණි. එසේ වුවත් ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ ආයතනය විසින් ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයේ වැඩ අවසන්කර ඇවර කිරීමේ ගිණුම් පිළියෙලකර භාර දීම සඳහා උපදෙස් ලබා දී නොතිබුණි. | ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය නඩත්තු කිරීම සඳහා අමතර වියදමක් සහ කාලයක් දැරීමට සිදුවීම. | මාර්ග ඉදිකිරීම් කටයුතු අවසන්කර තිබුණද හැටන් - නුවරඑළිය මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ඉඩම් අත්පත්කර ගැනීම සඳහා ගෙවීම් සිදුකළ යුතුව තිබුණි. එබැවින් ව්‍යාපෘතියේ ඇවර කිරීමේ ගිණුම් මේ දක්වා පිළියෙලකර නැත. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය විසින් ව්‍යාපෘතියේ වත්කම් සහ වගකීම් පවරා ගැනීමේ කටයුතු සිදුකළ යුතුව තිබුණු අතර ඉඩම් අත්පත්කර ගැනීම සම්බන්ධව නොවිසඳුනු ගැටළු වෙත අවධානය යොමුකළ යුතුය. |

**03.** **භෞතික ප්‍රගතිය**

**3.1** **ඉඩම් අත්පත්කර ගැනීමේ ගැටළු**

| **විගණන නිරීක්ෂණය** | **බලපෑම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
| --- | --- | --- | --- |
| 2011 වර්ෂයේ ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු ආරම්භකර තිබුණද 2018 දෙසැම්බර් 31 දිනවන විටද රජය සතු ඉඩම් කැබලි 677 ක් සමඟ මුළු ඉඩම් කැබලි 2501න් ඉඩම් කැබලි 703ක් සඳහා පමණක් එකතු වටිනාකම රු.මිලියන 31ක් වන්දි මුදල් ගෙවා තිබුණි. මීට අමතරව ඉඩම් කැබලි 32කට වන්දි ගෙවීම ප්‍රමාදවීම නිසා 2018 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 1ක් පොලී වශයෙන් ගෙවා තිබුණි. | හිමිකම් ගෙවීම ප්‍රමාදවීම නිසා වන්දි සඳහා ගෙවියයුතු පොළිය ඉහළ යාම | පිළිගනිමි | අමතර වියදම් බැහැර කිරීම සඳහා කඩිනමින් වන්දි නිරවුල් කිරීමට කටයුතු කළයුතු වීම |